


# තුරු සෙවණින් දොරට වඩින නන්දන ඇතුලත්මුදලි

## මුහුණට මුහුණ

### ශ්‍රීනාත් මද්දුමගේ

අපේ නිරීක්ෂණය අනුව නන්දන ඇතුලත්මුදලි මෙල්බන් පුරවරයේ සිටින අතළොස්සක් කලා ශිල්පීන් අතරින් වැඩිමනක්ම කැපී පෙනෙනුයේ මෙපුරවරයේ සිදුවන ඕනෑම කලා කටයුත්තක් මග නොහරින ශිල්පියකු ලෙසය. ඒ ඔහුගේ නිහතමාණීකම සහ සහෝදර ශිල්පි ශිල්පිනියනට ඔහු දක්වන සහයෝගය යයි අපි සිතමු. සන්නස ඔහු සමග පිළිසඳරකට යොමුවන්නට සිතුවේ අවුරුදු ගණනාවක් පෙරුම්පුරා ඔහු විසින් නිර්මාණය කරන ලද -තුරු සෙවනේ" සංගත තැටිය එළිදැක්වීමේ උළෙල සම්බන්ධයෙන් කතාබහක නියැලෙන්නට ය.

**ශ්‍රීනාත්**

නන්දන ඔබ කොහොමද මේ සංගීත ක්ෂෙත්‍රයට පිවිසුණේ?

**නන්දන**

මම මුලින්ම මේ වෙලාවේ මතක් කරන්න ඕනෙ මට සංගීතයේ අයන්න කියා දුන්න නැසී ගිය ඔස්ටින් මුණසිංහ ගුරුතුමාව. මා අධ්‍යපනය ලැබූ තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයේ එවකට සංගීත ආචාර්ය වරයා හැටියට කටයුතු කළේ ඒ මහතායි. ඔහු මගේ යම්කිසි දක්ෂතාවක් හඳුනාගෙන මට ගීත ගායනා කිරීමටත් තබ්ලාව වාදනය කිරීමටත් ගුරු හරුකම් දුන්නා. ඒ මහතාගේ මග පෙන්වීම යටතේ ප්‍රාදේශීය සහ සමස්ත ලංකා පාසල් තරග වලට සහභාගි වී අප පාසලට සම්මාන සහතික ලබා දෙන්නට අපට පුලුවන් වුණා. ඒ සමොනා ලාභී කණ්ඩායමට වාදකයකු ලෙස මම සහභාගි වුණා.

කෙසේ වෙතත් ඒ කාලයේ සිටම ගීත ගායනා කරන්නට ආසාවක් තිබුණා. මම පාසලෙන් පසුව සංගීත කණ්ඩායම් කීපයක ගායකයකු ලෙස සහ වාදකයකු ලෙස සහභාගි වුණා. ඔස්ට්‍රේලියාවට එන තෙක්ම මම සංගීත කටුයතු වන නියැලුණා.

**ශ්‍රීනාත්**

ඕබේ කියලා ගීත ඇල්බමයක් ඉදිරිපත් කරන්නට හිතුවෙ ඇයි?

**නන්දන**

ඒකත් අපූරු කතාවක්. මගේ රැකියාව අනුව ශ්‍රී ලංකාවේදී ගුවන් විදුලි සංස්ථාවේ අලුතින් නිර්මාණය කරනු ලැබූ මැදිරි කීපයක රාජකාරි කරන්නට අවස්ථාව ලැබුණා. එහිදී නොයෙක් ගායන ශිල්පීන් වාදන ශිල්පීන් මට හමුවුණා. එහිදී මගේ හිතට සියුම් ආශාවක් ඇතිවුණා කවදා හෝ මගේම ගීත කීපයක් නිර්මාණය කරන්නට. නමුත් ඒ කාලයේම ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වන්නට සිදුවණා නිසා ඒ අදහස ටික කාලයකට යටපත් කරගන්නට සිදුවුණා. අවුරුදු 20 කට පසුව ඒ අදහස මුදුන් පත් කරගන්න දැන් මට හැකි වෙලා තියෙනවා. වසර ගණනාවක් සිට නිර්මාණය කළ ගීත 12ක් ඇතුළත් තුරු සෙවනේ සංගත තැටිය බිහි වෙන්නෙ ඒ අනුවයි.

**ශ්‍රීනාත්**

ඔබ මෙල්බර්න් පුරවරයේ ගීත ගායනා කරන්නට පෙළඹුණේ කොහොමද?

**නන්දන**

මම ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණා කාලයේ සිටම එක් එක් සංගීත කණ්ඩායම් සමග ස්වෙච්ඡාවෙන් ගීත ගායනා කළා. මට මතක් වෙනවා වසර කීපයකට ප්‍රථම දයා සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් ස්ටාර්ස් එෆ් ලංකා ප්‍රසංගයට ගීතයක් ගායනා කළ හැටි. ඒව ගේම 1996 වසරේදී කැමරන් කොළඹගේ මහතා ඉදිරිපත් කළ ප්‍රසංගයකද මම ආධුනික ශිල්පියෙක් හැටියට ගීත ගායනා කළා. ඉන්පසුව මම ලූෂන් ප්‍රනාන්දු කුමුදුනී ප්‍රනාන්දු ගේ ප්‍රධානත්වයෙන් යුත් නිව් සවුන්ඩ්ස් සංගීත කණ්ඩායමේ තබ්ලා වාදකයෙක් සහ ගායකයෙක හැටියට සම්බනධ වුණා. දැනටත් මම ඒ සංගීත කණ්ඩායමේ ශිල්පියකු හැටියට කටයුතු කරනවා.

එසේම වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික ගායක ලායිකා-වන්ගේ සංගමය වන වික්ටෝරියන් ඇසෝසියේෂන් ඔෆ් ශ්‍රී ලන්කන් සිංගර්ස් - වාස් - සංගමයේ කාරක සභිකයෙක් හැටියටත් කටයුතු කරනවා.

## දොරට වැඩුම

**St Jude's Community Centre, 49 George Street, Scoresby Vic 3179**

**ශ්‍රීනාත්**

ඔබ රංගනයටත් සම්බන්ධයි නේද?

ඔබ ඔය අහන්නෙ මම මහාසාර නාට්‍යයට රංගනයෙන් එක් වීම ගැන නේද? මට ඒ ආරාධනාව ලැබුණේ මාලිනී ජයසිංහ මහත්මියගෙන්. ඇත්තටම මම මහාසාර නාට්‍යයට සම්බන්ධ වුණේ එහි ගායක කණ්ඩායමේ සාමාජිකයකු හැටියටයි.

එයට අමතරව 2005 දී උපාලි කන්නන්ගර විසින් පවත්වන ලද නවක තරු සන්දර්ශණයටත් ගායකයකු ලෙස සහභාගි වුණා.

**ශ්‍රීනාත්**

ඔබ ඔස්ටින් මුණසිංහ මහතාගෙන් පසුව සංගීතය හැදෑරීමක් කළේ නැද්ද?

**නන්දන**

ඇයි නැත්තෙ. මම අවුරුදු එකහමාරක් පමණ විශාරද වාසනා වීරකෝන් සංගීත ආචාර්යවරිය යටතේ සංගීතය හැදෑරුවා. මේ වෙලාවේ මම ඇයටත් ස්තුති කරන්න කැමතියි.

## මට සංගීතයේ මුල් පාඩම කියා දුන්නේ ඔස්ටින් මුණසිංහ සර්

**ශ්‍රීනාත්**

ඔබේ සංගත තැටිය පිළිබඳ විස්තරයක් කරන්න පුලුවන්ද?

**නන්දන**

මේ සංගත තැටියට ගීත 12ක් අඩංගු වෙනවා. මම වසර ගණනාවක් හෙම්හිට හෙම්හිට කරපු නිර්මාණ මෙයට ඇතුලත් වෙනවා. මෙහිදී ප්‍රවීණ ගීත රචකයන් සහ සංගීතඥයන් රැසකයෙග් ලැබුණ සහය අප්‍රමාණයි. ඒ අතරින් රෝහණ ධර්මකීර්ති රෝහණ වීරසිංහ කැමරන් කොළඹගේ මහින්ද බණ්ඩාර තරුපති මුණසිංහ අතුල ලෙව්කේ බණ්ඩාර කියන සංගීතඥයන්ද රවි සිරිවර්ධන මහින්ද දිසානායක දිවුල්ගනේ සිසිර දිසානායක යන ගී පද රචකයන්ද මට එක්වුණා. සහය ගායනයෙන් නෙලූ අධිකාරි මහත්මිය එක්වුණා. මේ සියලු දෙනාටම මම ඉතා අවංකව ස්තුතිවන්ත වෙනවා.

**ශ්‍රීනාත්**

මේ ගමන යන්න ඔබට තව කවුද උදව් කළේ?

**නන්දන**

වැඩ රාජකාරි බහුලව තිබියදීත් සංගීතයට මගේ ඇති ආසාව හඳුනාගෙන මට සහය දෙන මගේ ගමනට අත්වැලක් වන මගේ බිරිඳ සාජා ඇතුලත්මුදලි සහ මගේ දරුවන් වන නදීෂි හර්ෂා කසුන් දරුවන්වත් මේ වෙලාවෙ සෙනෙහසින් මතක් කරන්න කැමතියි. ඔවුන් මට විශාල ශක්තියක්.

**ශ්‍රීනාත්**

මේ සංගත තැටිය දොරට වඩින්නෙ කවදාද?

**නන්දන**

අප්‍රේල් මස 10 වන ඉරිදා සවස 4.30 ට ස්කෝස්බි හි ජෝර්ජ් ස්ට්‍රීට් හි අංක 49 පිහිටි සෙන්ට් ජූඩ් කොමියුනිටි සෙන්ටර් ශාලාවේදී තමයි මේ දොරට වැඩුම පැවැත්වෙන්නෙ. (මෙල්වේ අංකය 72 ජී 4) මම සියලු දෙනාටම විවෘත ආරාධනා කරනවා එදාට මේ ශාලාවට පැමිණ මාත් සමග මේ සතුට බෙදාහදා ගන්නා ලෙස.

නන්දන ඇතුලත්මුදලි අප මුලින් සඳහන් කළ ආකාරයට සෑම කලා ශිල්පියෙකුටම සහය දක්ව සහෝදර ශිල්පියෙකි. වසර ගණනාවක් ඔහුගේ සිතේ රජ කළ බලාපොරොත්තුව එළි දක්වන මොහොතේ සෙන්ට් ජූඩ් කොමියුනිටි හාලාවට පැමිණ ඔහු ශක්තියක් වන මෙන් අපි ඔබෙන් ඉල්ලා සිටිමු. නන්දනට අපේ සුබ පැතුම්.

වැඩි විස්තර සඳහා නන්දන 0425 772 427/ 9778 5684